# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

பொலிஸ் ஊடகப் பிரிவு

POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 1497 /2023

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2023

දිනය / திகதி / Date: 01/12/2023 පැය 1755

## මාධ්‍ය නිවේදනය

### නුගේගොඩ නගරයේ දුම්රිය හරස් මාර්ග අළුත්වැඩියා කටයුත්තක් හේතුවෙන් වාහන ගමනාගමනය සීමා කිරීම

මිරිහාන පොලිස් වසමේ නුගේගොඩ නගරය හරහා ගමන් කරන කැලණි වැලි දුම්රිය මාර්ගයේ ස්ටැන්ලි තිලකරත්න මාවත දුම්රිය හරස් මාර්ගයේ නඩත්තු කටයුත්තක් හේතුවෙන් එම මාර්ගයේ කොටසක් තාවකාලිකව වසා තැබීම සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව මගින් ඉල්ලීමක් කර ඇත.

ඒ අනුව 2023.12.02 වන දින උදෑසන 8.00 සිට 2023.12.03 වන දින උදෑසන 6.00 දක්වා කැලණි වැලි දුම්රිය මාර්ගයේ නුගේගොඩ නගරයේ ස්ටැන්ලි තිලකරත්න මාවතේ දුම්රිය හරස් මාර්ගය අයත් වන කොටස වසා තැබීමට කටයුතු කරන බැවින් එම මාර්ගය භාවිතා කිරිමට අපේක්ෂිත මහජනතාවගෙන් සහ රියදුරන්ගෙන් පහත විකල්ප මාර්ග භාවිතා කරන ලෙසට පොලිසිය ඉල්ලා සිටී.

### විකල්ප මාර්ග

- නුගේගොඩ සුපිරි වෙළඳ සංකීර්ණය හන්දියේ සිට කොළඹට ඇතුළු වන සියළුම වාහන නාවල මාර්ගය ඔස්සේ නාවල, නාරාහේන්පිට හංදිය ඔස්සේ කොළඹ දක්වා ගමන් කල හැක.

- නුගේගොඩ සුපිරි වෙළඳ සංකීර්ණය හන්දියේ සිට කිරුළපන, දෙහිවල, කළුබෝවිල සහ කොහුවල දෙසට ගමන් කරන සැහැල්ලු වාහන සියල්ලම නුගේගොඩ පොලිස් මුරපොල අසලින් ඇති පූර්වාරාම මාර්ගය ඔස්සේ කිරුළපන සිබල් හංදිය දෙසට ගමන් කර හයිලෙවල් මාර්ගයට පිවිස ගමන් කල හැක.

- හයිලෙවල් මාර්ගයේ සිට නුගේගොඩ සුපිරි වෙළඳ සංකීර්ණය හන්දිය දෙසට ඇතුළු වන සියළුම සැහැල්ලු වාහන නුගේගොඩ දුම්රිය ස්ථානය අසලින් දකුණු දෙසට ජනතා පොළ මාර්ගයෙන් පරණ කැස්බෑව මාර්ගයට පැමිණ වමට හැරී නුගේගොඩ සුපිරි වෙළඳ සංකීර්ණය හන්දිය දෙසට ගමන් කළ හැක.

- ❖ හයිලෙවල් මාර්ගයෙන් නුගේගොඩ සුපිරි වෙළඳ සංකීර්ණය හන්දිය දෙසට ගමන් කරන සියළුම බර වාහන හයිලෙවල් මාර්ගයෙන් ගම් සභා හංදියට පැමිණ වමට හැරී කට්ටිය හංදියට ගමන් කර වමට හැරී පරණ කැස්බෑව මාර්ගය ඔස්සේ නුගේගොඩ සුපිරි වෙළඳ සංකීර්ණය හන්දිය දෙසට ගමන් කල හැක.

- ❖ නුගේගොඩ සුපිරි වෙළඳ සංකීර්ණය හන්දියෙන් හයිලෙවල් මාර්ගය දෙසට ගමන් කරනු ලබන බස් රථ ඇතුළු සියළුම බර වාහන පරණ කැස්බෑව මාර්ගයේ කට්ටිය හංදියට ගමන් කර දකුණට හැරී ගම්සභා හංදියෙන් හයිලෙවල් මාර්ගයට ගමන් කල හැක.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**